සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

# දෙවන වාර පරීක්ෂණය

33 S I

10 ශ්‍රේණිය | ඉතිහාසය - I | කාලය පැය එකයි

උපදෙස් :
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න. සපයා ඇති පිළිතුරු ලියන පත්‍රයේ ප්‍රශ්න අංකයට අදාළ පිළිතුරු අංකය ඇති කවය තුළ (x) ලකුණ යොදන්න.
(iii) මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 40 කි.

---

(01) ශ්‍රී ලංකා ඉතිහාසය හැදෑරීමට ඉවහල් වන ක්‍රි.ව. පස්වන හෝ හයවන සියවසේ රචනා කරන ලද ග්‍රන්ථය වන්නේ,
1. චූලවංසය 2. දීපවංසය 3. මහාවංසය 4. ථූපවංසය

(02) ශ්‍රී ලංකාවට පැමිණ මෙරට තොරතුරු සොයා බලා ඒ පිළිබඳව වාර්තා තබන ලද විදේශීය ලේඛකයෙක් වන්නේ,
1. ටොලමි 2. සොක්‍රටීස් 3. ඇරිස්ටෝටල් 4. පාහියන් හිමි

(03) ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳව තොරතුරු හමුවන වෙරළාශ්‍රිත එළිමහන් කඳවුරක් වන්නේ,
1. කුරුවිට බටදොඹලෙන 2. බූන්දල
3. පාහියන්ගල 4. සීගිරිය අලිගල

(04) ප්‍රාග් ඓතිහාසික යුගය පිළිබඳව තොරතුරු අධ්‍යයනය කිරීමේ දී පහතරට තෙත් කලාපයෙන් හමුවී ඇති සාධකයක් නොවන්නේ,
1. ගල් ආයුධ ලෙස කහඟ ගල් හා බිම්වීදුරු ගල් භාවිත කර ඇත.
2. ගස් ගොළුබෙල්ලන් වැඩිපුරම ආහාරයට ගෙන ඇත.
3. වල්දෙල් හා ඇට්කෙහෙල් වැනි දෑ ආහාරයට ගෙන ඇත.
4. ගස් බෙන හා ගල් ගුහා වෙනුවට එළිමහන් වාසස්ථාන භාවිත කර ඇත.

(05) පහත තොරතුරු අතුරින් පොළොන්නරුව රාජධානි සමයේ සිදු වූ විශේෂ සිදුවීමක් නොවන්නේ,
1. අසේල රජු දවස එළාර ආක්‍රමණය
2. චීන ආක්‍රමණ තුනක් එල්ල වීම
3. ලම්බකර්ණ වංශය බලයට පත්වීම
4. පළමුවන ගජබාහු රජු ඉන්දියාවේ කේරළ රාජ්‍යයට යෑම

(06) මුල් ඓතිහාසික යුගයේ විසූ මිනිසුන් ජනාවාස ගොඩනගා ගෙන ඇත්තේ,
1. ජලය ආශ්‍රිතව 2. ගංගා මූල් කරගෙන
3. වැවක් කේන්ද්‍ර කොට ගෙන 4. වත් පොහොසත්කම් අනුව

(07) මුල් ඓතිහාසික යුගයේ වංශකථාවල හා සෙල්ලිපිවල 'ඔළගම්' යනුවෙන් හඳුන්වා ඇත්තේ,
1. වෙළෙඳගම් 2. ජනතාව විසින් අතහැර දැමූ වැව්ගම්
3. ගොපල්ලන් විසූ ගම් 4. වඩුවන් විසූ ගම්

(08) ක්‍රි.පූ. 250 තරම් ඈත කාලයක දී රචිත බ්‍රාහ්මී සෙල්ලිපියක 'පුර කමත' යනුවෙන් හඳුන්වා ඇත්තේ,
1. නගරයේ ප්‍රධාන වාස්තු ශිල්පියා 2. නාගරික වාස්තු විද්‍යාඥයා
3. රාජ්‍ය අංශයේ ප්‍රධානියා 4. වෙළෙඳ අංශයේ ප්‍රධානියා



EXAMRESULTS.LK
CamScanner

(09) ප්‍රථම වතාවට සිය ප්‍රතිමල්ලවයාගේ සොහොනට නිසි ගෞරව පැවැත්වීමට අණ කිරීමෙන් සිය රාජතාන්ත්‍රික බව පළ කරන ලද රජතුමා වන්නේ,

1. කාවන්තිස්ස රජු
2. වසභ රජු
3. දුටුගැමුණු රජු
4. ධාතුසේන රජු

(10) පළමුවන විජයබාහු රජතුමා විසින් විවාහ කර ගන්නා ලද තිලෝකසුන්දරී නම් කුමාරිකාව අයත් රාජ වංශය වන්නේ,

1. පාණ්ඩ්‍ය
2. චෝළ
3. කාලිංග
4. ලම්බකර්ණ

(11) 'අල්-බලසූරි' නම් අරාබි ඉතිහාසඥයා තම පොත්පත්වල ලංකාව හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?

1. සෙරන්ඩිබ්
2. සෙයිලම
3. රතුකැට දිවයින
4. සිලෝන්

(12) ශ්‍රී ලංකාවේ පැරණිතම වගා ක්‍රමය වන්නේ හේන් වගාවයි. 'බුත්සරණ' නම් සාහිත්‍ය කෘතියේ හේන් හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?

1. පිටිබිම
2. හේන
3. සේන්
4. සෙහෙන්

(13) හේන් ගොවිතැනේ දී අය කරන ලද විශේෂ බද්දක් වන්නේ,

1. බොජකපති
2. දකපති
3. කෙටූ කනබ අය
4. මතරමජිබක

(14) හතරවන කාශ්‍යප රජතුමා විසින් නිර්මාණය කරන ලද විශේෂ රෝහලක් වන්නේ,

1. ආලාහන පිරිවෙන
2. මැදිරිගිරියේ රෝහල
3. උපසග්ගරෝගනාස
4. සොත්ථිසාලා

(15) සාහිත්‍ය මූලාශ්‍රවල මහාග්‍රාමයේ සිට අනුරාධපුරයට පැමිණි තැනැත්තෙකු විසින් වෙළෙඳපොළකින් සුවඳ විලවුන් මිලදී ගෙන ඇති බවට සඳහන් ය. එම තැනැත්තා වන්නේ,

1. ගෝඨයිම්බර
2. සුරනිමල
3. වේළුසුමන
4. ථේරපුත්ථාභය

(16) දකුණු ඉන්දියාවේ ක්‍රිෂ්ණා නදී නිම්නයේ ඇති වූ ආහාර හිඟයකට මෙරට නිපදවන ධාන්‍ය යවන ලද රජතුමා වන්නේ,

1. පණ්ඩුකාභය රජු
2. වසභ රජු
3. මහසෙන් රජු
4. යසලාලක තිස්ස රජු

(17) 'නරයින්ට ඊශ්වර දෙවි' යන රාජ්‍යත්ව සංකල්පය භාවිත කරන ලද්දේ,

1. මහසෙන් රජු
2. ඉළනාග රජු
3. මහානාග රජු
4. කූටකණ්ණ අභය රජු

(18) පංච කකුධ භාණ්ඩවලට අයත් නොවන්නේ,

1. වල්විදුනාව
2. මිරිවැඩි සඟල
3. මගුල් කඩුව
4. මගුල් මුද්ද

(19) වල්ලිපුරම් රන්පතට අනුව වසභ රජතුමාගේ කාලයේ දී යාපනය හඳුන්වා ඇත්තේ,

1. නකදිව
2. මාලදිවයින
3. නයිනතිවු
4. යාපන දිවයින

(20) ගැබිණි මව්වරුන් සඳහා 'පසවන්තිනාම සාලා' යන නමින් ප්‍රසූතිය සඳහා මාතෘ නිවාස ඉදිකරන ලද්දේ,

1. හතරවන උපතිස්ස රජු
2. පළමුවන උපතිස්ස රජු
3. පස්වන මිහිඳු රජු
4. හතරවන මහින්ද රජු

(21) පැරණි මූලාශ්‍රවල 'ලපන' යනුවෙන් හඳුන්වා ඇත්තේ,

1. නැට්ටුවන්
2. චිත්‍ර ශිල්පීන්
3. කවීන්
4. නිර්මාණ ශිල්පීන්



CS CamScanner

(22) අනුරාධපුරය නගරයක් ලෙස වර්ධනය වීමට තුඩු දුන් නිශ්චිත ප්‍රධාන සාධකයක් වන්නේ,
1. බටහිර වෙරළේ පිහිටි මාතොට වරාය හා නැගෙනහිර වෙරළේ පිහිටි ත්‍රිකුණාමල වරාය
2. මුටසිව රජුගේ දේශපාලන ප්‍රතිපත්ති
3. උතුරින් දඹකොළ පටුන වරාය පිහිටීම
4. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මධ්‍යගතව පිහිටා තිබීම

(23) පාරිශුද්ධත්වය සංකේතවත් කිරීමට පැරණි සෙල්ලිපිවල යොදාගත් සංකේතය වන්නේ,
1. වටාපත 2. හංසයා 3. හක්ගෙඩිය 4. ඉර හඳ

(24) මහවැලි ගඟේ අතු ගංගාවක් වූ අඹන් ගඟ හරස් කර නිර්මාණය කළ ඇළ මාර්ගය වන්නේ,
1. අංග මැඩිල්ල ඇළ 2. යෝධ ඇළ
3. ඇළහැර ඇළ 4. මිනිපේ ඇළ

(25) ක්‍රි.පූ. දෙවන සියවසේ දී සෙල්ලිපිවල 'අධික' යන නමින් හඳුන්වා ඇත්තේ,
1. ඇළ මාර්ග ඉදිකිරීම සම්බන්ධයෙන් කටයුතු කළ නිලධාරියා
2. වැව් භාරව සිටි නිලධාරියා
3. පොකුණු අලංකාර කරන ලද නිලධාරියා
4. වෙහෙර විහාර අලංකරණය කරන ලද නිලධාරියා

(26) පෞද්ගලික ජල පරිහරණයේ දී ජලයේ නියමිත ප්‍රමිතිය සහ සිසිලනය ආරක්ෂා කර ගැනීමට අතීතයේ ඉදිකරන ලද ළිං විශේෂයක් වන්නේ,
1. නළ ළිං 2. ඌරාකැට ළිං 3. උණුදිය ළිං 4. උල්පත් ළිං

- **අංක 27 හා 28 යන ප්‍රශ්නවලට පහත දැක්වෙන තොරතුරු ඇසුරින් පිළිතුරු සපයන්න.**

A - වී ඇටයක ප්‍රමාණයේ තැල්ලක කොටසක් හමු වීම
B - වර්ණාලේපිත උළු හමු වීම
C - කිරිමඩු ශාන්ති කර්මය පැවැත්වීම
D - සෙල්සියස් අංශක 1538 වඩා උෂ්ණත්වයක් අවශ්‍ය වේ

(27) ජේතවන කැණීම්වලින් සොයා ගන්නා ලද තොරතුර ඇතුළත් වරණය වන්නේ,
1. A 2. B 3. C 4. D

(28) ඌව පළාතට හා සබරගමු පළාතට ආවේණික තොරතුර ඇතුළත් වරණය වන්නේ,
1. A 2. B 3. C 4. D

- **අංක 29 සිට 31 දක්වා ප්‍රශ්නවලට පහත දැක්වෙන මැනීම් ක්‍රම ඇසුරින් පිළිතුරු සපයන්න.**

A - අමුණු B - ගුන්ජා C - ආංගුල D - වස

(29) ඉහත මිනුම් ක්‍රමවලට අනුව කාලය මැනීම සඳහා යොදා ගන්නා ලද්දේ,
1. A 2. B 3. C 4. D

(30) පුරාණයේ දී බර මැනීමට යොදා ගන්නා ලද්දේ,
1. A 2. B 3. C 4. D

(31) ගොවිතැන් සඳහා ඉඩම් භාවිතයේ දී අවකාශය මැන ගැනීමට භාවිත කරන ලද්දේ,
1. A 2. B 3. C 4. D



CamScanner

(32) තිස්ස නම් විහාරයකට කරීස අටක ඉඩමක් පූජා කළ බව සඳහන් වන සෙල්ලිපිය අයත් වන්නේ කිනම් රාජ්‍ය සමයට ද?

1. වසභ රාජ්‍ය සමයට
2. පණ්ඩුකාභය රාජ්‍ය සමයට
3. මහසෙන් රාජ්‍ය සමයට
4. කූටකණ්ණාභය රාජ්‍ය සමයට

(33) 'ගාවුත කණු' නමින් හැඳින්වූ ගල් කණු සිටුවීමට නියෝග කළ රජතුමා වන්නේ,

1. පරාක්‍රමබාහු රජතුමා
2. විජයබාහු රජතුමා
3. පරාක්‍රම පාණ්ඩ්‍ය රජතුමා
4. නිශ්ශංකමල්ල රජතුමා

(34) 2009 වර්ෂයේ දී පුරාවිද්‍යාඥයන් විසින් සොයා ගන්නා ලද දේවාලයක නටබුන් හමුවී ඇති ගල්පාය නම් ප්‍රදේශය අයත් දිස්ත්‍රික්කය වන්නේ,

1. ගාල්ල
2. මාතර
3. කෑගල්ල
4. රත්නපුර

(35) වර්තමානයේ දී අප භාවිත කරන ලද ඉලක්කම් ක්‍රමය හඳුන්වන්නේ,

1. හින්දු ඉලක්කම්
2. ශක ඉලක්කම්
3. රෝම ඉලක්කම්
4. අරාබි ඉලක්කම්

(36) ක්‍රිස්තු වර්ෂයෙන් නවවන සියවසේ රචනා වූ සෙල්ලිපිවල 'එක්තැන්සමිය' යන යෙදුමෙන් හඳුන්වා ඇත්තේ,

1. එකගතාවය
2. අධිකරණය
3. ගම් සභාව
4. රාජ්‍ය සභාව

(37) සමාජ ධූරාවලියේ ප්‍රභූවරුන්ගේ මට්ටමට පහළින් සිටියේ රටේ සාමාන්‍ය ජනතාවයි. සෙල්ලිපිවල ඔවුන් හඳුන්වා ඇත්තේ,

1. කුඩීන් යනුවෙන්
2. වොහාර යනුවෙන්
3. ධනක්කීතදාස යනුවෙන්
4. ලපන යනුවෙන්

(38) බදු නීතිය යටතේ රජුට අයත් ඉඩම්වල වගා කිරීම වෙනුවෙන් ගෙවන ලද බද්ද වන්නේ,

1. දකපති
2. කැති අඩ
3. බොජකපති
4. මතරමජිබක

(39) නිසි කාලයට සී සෑම නොකරන පුද්ගලයින්ට කළං පහක දඩයක් නියම කිරීම සම්බන්ධ නීතිය ඇතුළත් අභිලේඛනය වන්නේ,

1. කළුදියපොකුණ සෙල්ලිපිය
2. කොණ්ඩවට්ටවාන් ටැම්ලිපිය
3. බදුලු ටැම්ලිපිය
4. මිහින්තලා පුවරු ලිපිය

(40) සාලිය කුමරුගේ බිරිඳ වූ අශෝකමාලා දුටුගැමුණු රජුගේ මාළිගයේ දී රසවත් ලෙස ආහාර පිළියෙල කොට කාගෙත් සිත් දිනාගත් බව සඳහන් ග්‍රන්ථය වන්නේ,

1. සහස්සවත්ථුප්පකරණය
2. සද්ධර්මාලංකාරය
3. සද්ධර්මරත්නාවලිය
4. දම්පියාඅටුවා ගැටපදය



CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි / பதிப்புரிமையுடையது / All Rights Reserved

# දෙවන වාර පරීක්ෂණය

| 33 | S | II |
|---|---|---|

**10 ශ්‍රේණිය** | **ඉතිහාසය - II** | **කාලය පැය තුනයි මි.10**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස් :-

- I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.
- පළමු ප්‍රශ්නයට ලකුණු 30 ක් ද, අනෙක් එක් එක් ප්‍රශ්නයට ලකුණු 18 බැගින් ද හිමි වේ.

## I - කොටස

(01) අ) i. සපයා ඇති ලංකා සිතියමෙහි පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

මිනිහාගල්කන්ද / යාපනය / කලා වැව / දැදුරු ඔය / ඉබ්බන්කටුව / දඹකොළ පටුන / මහියංගනය / අනුරාධපුරය / මාගම / ශ්‍රංචාමඩම / දෙවුන්දර / පාහියන්ගල (ල. 12)

ii. සපයා ඇති ලෝක සිතියමේ පහත සඳහන් ස්ථාන ලකුණු කර නම් කරන්න.

රතු මුහුද / ඉතාලිය / කැලිකට් / ජපන් දූපත් / පර්සියන් බොක්ක / සුමාත්‍රා (ල. 06)

ආ) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A) ලම්බකර්ණ වංශයේ ආරම්භක පාලකයා කවුරුන් ද?
B) මාගම රාජධානියේ ආරම්භක පාලකයා කවුරුන් ද?
C) තිස්සමහාරාම වැව ඉදිකරන ලද්දේ කවුරුන් විසින් ද?
D) පළමුවන පරාක්‍රමබාහු රජතුමා උපන් ග්‍රාමය වර්තමානයේ හැඳින්වෙන නම කුමක් ද?

(ල. 04)

ඇ) A සහ B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට ඒ ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. i) A රූපය නම් කරන්න.
ii) මෙය නිමවා ඇත්තේ මොනවායින් ද?
iii) මෙම රූපයෙහි ඇති නිර්මාණය හමුවූ ස්ථානය ලියන්න.
iv) මින් පිළිබිඹු වන්නේ කුමක් ද? (ල. 04)



A රූපය

2. i) B රූපය නම් කරන්න.
ii) මෙය සොයා ගන්නා ලද දිස්ත්‍රික්කය ලියන්න.
iii) මෙහි තෙල් ගබඩා කර ඇත්තේ කොහේ ද?
iv) මෙම නිර්මාණය දක්නට ඇත්තේ කුමන විහාරයෙහි ද? (ල. 04)



B රූපය

# II - කොටස

(02) i. ආදි මානවයාගේ තොරතුරු ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A) සාමාන්‍යයෙන් වැඩුණු පිරිමියෙකුගේ උස කොපමණ ද?

B) වැඩුණු කාන්තාවකගේ මොළයේ ඝනත්වය කොපමණ ද?

C) පහතරට තෙත් කලාපයේ මානවයා රුචිකත්වයක් දැක්වූ ආහාරයක් නම් කරන්න. (ල. 03)

ii. ප්‍රාග් ඓතිහාසික මානවයා තාක්ෂණික මෙවලම් සඳහා භාවිත කරන ලද ගල් මෙවලම් දෙකක් ලියන්න. (ල. 04)

iii. ප්‍රාග් ඓතිහාසික මානවයන් ජීවත් වූ ලෙන් දෙකක් නම්කර ඔවුන්ගේ ආහාර රටාව උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න. (ල. 05)

iv. ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අභිචාර විධි උදාහරණ තුනක් මගින් පැහැදිලි කරන්න. (ල. 06)

(03) i. පහත දැක්වෙන ස්ථාන අයත් ඓතිහාසික යුග නම් කරන්න.

A) ඉබ්බන්කටුව B) අනුරාධපුරය C) බූන්දල (ල. 03)

ii. පූර්ව ඓතිහාසික යුගයේ තාක්ෂණයේ ඇති වූ වෙනස්කම් දෙකක් ලියන්න. (ල. 04)

iii. මුල් ඓතිහාසික යුගයේ මිනිසාගේ ජීවන රටාව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ල. 05)

iv. මුල් ඓතිහාසික යුගයේ වෘත්තිය පදනම් කරගෙන ජනාවාස ව්‍යාප්ත වූ ආකාරය කරුණු තුනක් මගින් පැහැදිලි කරන්න. (ල. 06)

(04) i. පහත දක්වා ඇති රජවරුන් භාවිත කළ රාජ්‍යත්ව සංකල්ප ලියා දක්වන්න.

A) මහසෙන් රජතුමා B) නිශ්ශංකමල්ල රජතුමා

C) පළමුවන කාශ්‍යප රජතුමා (ල. 03)

ii. පහත රජවරුන්ට රාජ්‍ය උරුමය හිමි වූ ආකාරය සඳහන් කරන්න.

A) වසභ රජුගෙන් පසු වංකනාසිකතිස්ස කුමරුට

B) දුටුගැමුණු රජුගෙන් සද්ධාතිස්ස කුමරුට (ල. 04)

iii. අතීතයේ රජවරු සමාජ සුභසාධනය සඳහා කටයුතු කළ ආකාර උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න. (ල. 05)

iv. වසභ රජතුමාගේ දේශපාලන, ආර්ථික හා ආගමික කටයුතු උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ල. 06)

(05) i. පහත දැක්වෙන සිද්ධීන්ට සම්බන්ධ රජවරුන් නම් කරන්න.

A) දකුණු ඉන්දියාවේ චේර රාජ්‍යයේ උත්සවයකට සහභාගී වූ ලම්බකර්ණ වංශයේ පාලකයා

B) රුවන්වැලි සෑයේ පූජාවක් සඳහා අවශ්‍ය වූ වීදුරු පබළු ගෙන ඒමට රෝමයට දූතයන් යැවූ රජතුමා

C) විසි වතාවක් චීනයට දූතයන් යවා සබඳතා පවත්වා ඇති රජතුමා (ල. 03)

ii. හේන් වගා කිරීම වෙනුවෙන් අය කරන ලද බදු වර්ග දෙකක් ලියන්න. (ල. 04)

iii. "ශ්‍රී ලංකාවේ පැරණිතම ගොවිතැන වූයේ හේන් ගොවිතැනයි." එය උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න. (ල. 05)

iv. පුරාණ කාලයේ දී මෙරට වී ගොවිතැන සහ සත්ත්ව පාලනය ඉතා දියුණු මට්ටක තිබූ බව උදාහරණ තුනක් මගින් පැහැදිලි කරන්න. (ල. 06)



CamScanner

(06) i. පහත දැක්වෙන වචනවල අර්ථය ලියන්න.

A) අබල වපර B) වේලෛයික්කාර හමුදාව C) කඹොජ මහ පුගිය (ල. 03)

ii. දකුණු ඉන්දියානු සම්භවයක් ඇති වෙළෙඳ සංවිධාන දෙකක් ලියන්න. (ල. 04)

iii. මිහිඳු මහරහතන් වහන්සේ මෙරටට පැමිණීමත් සමග බුද්ධදහම හා ඊට අදාළ පුද පූජා පිළිවෙත් මෙරට සමාජය තුළ ශීඝ්‍රයෙන් පැතිර ගිය ආකාරය උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න. (ල. 05)

iv. බුද්ධදහම මෙරට සමාජයේ මුල් බැස ගැනීමත් සමග මෙරට වෙනත් ආගම් ව්‍යාප්ත වී ගිය ආකාරය උදාහරණ තුනක් මගින් පැහැදිලි කරන්න. (ල. 06)

(07) i. පහත සිද්ධීන් සම්බන්ධ පුද්ගලයින් නම් කරන්න.

A) සමන්තපාසාදිකාව රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

B) මාතලේ අළු විහාරයේ දී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ කිනම් රජතුමාගේ රාජ්‍ය අනුග්‍රහය යටතේ ද?

C) සීගිරිය නිර්මාණය කළ රජතුමා කවුරුන් ද? (ල. 03)

ii. පුරාණ කාලයේ දී මෙරට භාවිත කරන ලද භාෂා දෙකක් ලියන්න. (ල. 04)

iii. පුරාණ කාලයේ අපේ රටේ විසූ කවියෝ බුදු දහමින් ලද හික්මීම සහ ස්වභාවධර්මය සමග නිරන්තරයෙන් කටයුතු කළ ආකාරය උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න. (ල. 05)

iv. අතීතයේ දී මෙරට පාලකයෝ වාර්ගික සහජීවනය අගය කළ ආකාරය උදාහරණ තුනක් මගින් පැහැදිලි කරන්න. (ල. 06)

## III - කොටස

(08) i. පහත දැක්වෙන වැවක අංගවලින් කෙරෙන කාර්යයන් ලියන්න.

A) රළපනාව B) සොරොව්ව C) බිසෝකොටුව (ල. 03)

ii. මහ වැව් ඉදිකරන ලද පාලකයින් දෙදෙනෙක් පහත දක්වා ඇති අතර ඔවුන් විසින් ඉදිකරන ලද වැව බැගින් ලියා දක්වන්න.

A) මහසෙන් රජු B) ධාතුසේන රජු (ල. 04)

iii. වාරි කර්මාන්ත ඉදිකිරීමේ ඉතිහාසයේ තවත් සන්ධිස්ථානයක් වන්නේ ඇළ මාර්ග ඉදිකිරීමයි. ජල කළමනාකරණයට ඇළ මාර්ග යොදාගත් ආකාරය උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න. (ල. 05)

iv. අතීතයේ ශිල්පීන් විශිෂ්ට වාස්තු විද්‍යාත්මක නිර්මාණ කළ බව උදාහරණ තුනක් මගින් පැහැදිලි කරන්න. (ල. 06)

(09) i. පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

A) රෝහල් දහ අටක් ඉදි කරන ලද පාලකයා කවුරුන් ද?

B) ආලහන පිරිවෙන ඉදිකරන ලද්දේ කවුරුන් විසින් ද?

C) අනුරාධපුරයේ ප්‍රථමයෙන් ම සොත්ථිසාලා සහ සිවිකාසාලා ඉදිකරන ලද පාලකයා කවුරුන් ද? (ල. 03)

ii. පුරාණයේ යකඩ නිස්සාරණය සිදුකළ බවට සාක්ෂි ලැබෙන ප්‍රදේශ දෙකක් ලියන්න. (ල. 04)

iii. ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණය කිරීමේ තාක්ෂණය පැවතුණු ආකාරය උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න. (ල. 05)

iv. ඈත අතීතයේ දී බුදු දහම ජනතාව අතර ප්‍රචලිතව තිබුණද, කෘෂිකාර්මික අවශ්‍යතා සඳහා එකල ජනතාව වෙනත් යාතු කර්ම පූජා වෙත ද නැඹුරු වී සිටි බව උදාහරණ තුනක් මගින් පැහැදිලි කරන්න. (ල. 06)



CS CamScanner